SRI LANKA SUMITHRAYO

# මධ්‍යස්ථානයෙන් ඔබ්බට

ශ්‍රී ලංකා සුමිත්‍රයන්ගේ කාර්යභාරය පුළුල් වූ විෂයකි .ඒවා විග්‍රහ කිරීම කාලෝචිත යැයි හැඟේ .අපේ සේවය මධ්‍යස්ථානයේ බිත්ති හතරට සීමා වූවක් නොවේ.එසේ වන්නේ නම් අපගේ මහඟු සේවය අප විසින්ම ලඝු කර ගන්නවා ඇත.

ආයතනික හා පරිපාලනයට පරිබාහිරව මධ්‍යස්ථානය තුලදී අපගේ සේවය ප්‍රධාන අවස්ථා තුනකින් යුතු වෙයි .එනම් මධ්‍යස්ථානයට ඇතුල්වන අමතන්නන් සුහදව පිළිගෙන සම්මුඛව මැනවින් හිතමිතුරුකරණය කිරීම , දුරකථන අමතන අමතන්නට හොඳින් සවන්දී හිතමිතුරුකරණය කිරීම සහ ලිපි එවන අමතන්නන්ට සැනින් සහන සීලි පිළිතුරකින් සංග්‍රහ කිරීම වේ .එයින් අපේ කාර්යභාරය අවසන් වේද ?නැත .එසේ නම් කළ යුතු තවත් සේවාවන් තිබේද ?ඔව් .ඒ මොනවාද ?

අපේ ප්‍රධාන අරමුණ වනුයේ සියදිවි නසා ගැනිම අවම කිරීමයි .එසේ නම් සිය දිවි නසා ගැනීමට තැත් කළ අය හමුවීමට  අප යා යුත්තේ  ප්‍රදේශයේ රෝහලකට නේද ?ඔව්. එසේ නම්, කළ යුත්තේ මුලින්ම රෝහලේ වෛද්‍ය අධිකාරී ගේ හෝ වෙනත් බලධාරියෙකුගේ ලිඛිත අවසරයක් ලබා ගැනීමයි .මෙහිදී ආරක්ෂක අංශ, වාට්ටු භාර හෙද සේවක මණ්ඩලය සමඟ අන්තර් සහසම්බන්ධතාවයක් පවත්නා ගැනීම අපේ සම්පත් දායකත්වයට මහඟු රුකුලක් වෙනවා ඇත. බොයෝ දුරට දවල් 11.45 පමණ වන විට වෛද්‍ය වරුන්ගේ වාට්ටු සේවය අහවර වනු ඇත. ඉන් පසු අදාල වාට්ටු වලට යෑම උචිත බව අත්විද ඇත. දවල් 12.00ට කෑම පැය නිසා කළබලකාරී අවස්ථාවකි. එබැවින් වාට්ටුවට ඇතුලු වූ පසු , එහි ප්‍රදශර්ණය කර ඇති පුවරුවේ දැක්වෙන වස විස පානය කර ඇති සංඛ්‍යාව දැන ගෙන ඒ අනුව අපේ කාලය කළමණාකරණය කර ගැනීම පහසු වේ. තවද, මෙහිදී ජීවිතය නසා ගැනීමට තැත් කළ අය ද ,ඔවුන්ගේ භාරකරුවන් ද, ඇඳන් මත තනිවී සිටින රෝගීන් ද අපේ අවධානයට යොමු විය යුතුය. රෝගීන්ගේ ලිපිනයන් ලබා ගැනීමට හැකි වුවහොත් ඔවුන් සමග ලිපි හුවමාරු කර ගැනීමට අවස්ථාව සලසා තවත් ඔබ්බට ද යා හැකි වේ.

මෙයින් ද ඔබ්බට ගොස් අපේ සේවය ලබා දීම අපේ කාර්‍ය භාරය වේ. එනම් රාජ්‍ය ආයතන , සමාජයේ විවිධ සමිති සමාගම් , කමර්ාන්ත ශාලා සේවක පිරිස් හා පාසැල් දූ දරුවන් යනාදියයි.

දැන් පාසැල් වැඩසටහන් ගැන පමණක් සාකච්ඡා කරමු. පාසැල් පරිශ්‍රය තුලදී පැයක පමණ කාලයක් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ලිඛිත අවසරය ලබා ගැනීම අනිවාර්‍ය වේ. ඉන්පසු පාසැල් විදුහල්පතිවරු  සමඟ සාකච්ඡා කර සුදුසු දිනයක් හා වේලාවක් වෙන් කරවා ගත යුතු වේ. මේ සඳහා නව වසරට අනුමැතිය ඉල්ලන විට පසුගිය වසරේ මෙම වැඩ සටහනේ ප්‍රගතිය

සදහන් කිරීම නිසා අප කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය තහවුරු වන බැවින් නව වසරට අවසර දීම කිසිම පැකිලීමකින්

තොරව කරනු ඇත. වැඩසටහන පවත්වන වේලාව තුළ අවම වශයෙන් එක් ගුරු භවතෙක් වත් සම්බන්ධකර ගැනීම අනිවායර් වේ. වැඩ සටහන නිමාවූ පසු විදුහල්පතිගේ ලොග් සටහන් පොතේ ‘ලොග් ඇන්ට්‍රියක් ‘ ලිවීමට අමතක නොකලමනාය. වැඩසටහනට අප කවුද? කරන්නේ කුමක් ද? එය කා වෙනුවෙන් ද? සහ අප දෙනු ලබන පණිවිඩය යනුවෙන් කෙටි සරළ දැනුවත් කිරීම් විය යුතු වෙයි. මුලින් මෙය උ/පෙළ සිසුන්ට සීමා වුව ද දැන් දැන් පහළ පන්ති වලට සිසුන් සඳහා පැවැත්වීමට විදුහල්පතිවරු ඉල්ලීම් කර ඇති අතර , වත්මන් හී මත් රකුසා පාසැල්වල සැරිසරමින් සිටින බැවින් එය නිවාරණය කිරීමට සුලුවෙන් හෝ අපේ දායකත්වය ඉල්ලා ඇති නිසා ඊට අප සූදානම් වී සිටිය යුතුවෙයි. මේ සඳහා මනා පෙර සූදානම වැදගත්ය. සෑම විටම අධ්‍යක්ෂවරයෙක් සම්බන්ද විය යුතුය. මාතලේ ශාඛාව ‘ඔබ්බට “යන මාවතේ පිය සටහන් කිපයකි  මේ. එතනින් ඔබ්බට යාම ඉදිරියට තබමි.

**සේන - මාතලේ ශාඛාව**